## මාධ්‍ය උපදේශනයඃ

## මානව අයිතිවාසිකම් සහ ත්‍රස්තවාදය පිටු දැකීමඃ එක්සත් ජාතීක්ගේ විශේෂඥයෙකු

## ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට සංචාරයක් අරඹයි.

**ජිනීවාඃ (2017 ජුලි 06.)**

මානව අයිතිවාසිකම් සහ ත්‍රස්තවාදය පිටු දැකීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු බෙන් එමර්සන් මහතා ත්‍රස්තවාදය පිටු දැකීමේ කටයුතු පිළිබඳ ක්ෂේත්‍රයන්හි මුල පිරුම් සහ ඒවා මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනයට සහ ආරක්ෂා කිරීමට බලපාන ආකාරය ගැන තමා විසින්ම තොරතුරු රැස් කිරීම සඳහා ජුලි 10 සිට 14 දක්වා ශ්‍රී ලංකාවේ නිල සංචාරයක යෙදෙනු ඇත.

''ත්‍රස්තවාදය පිටු දැකිමේ ප්‍රතිපත්ති සහ නීති රාමුව මෙන්ම අදාල ව්‍යවස්ථා පනත් සකස් කිරීමට සහ කෙටුම්පත් කිරීමට ආණ්ඩුව විසින් ගනු ලබන පියවර අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතියට අනුකූල බව සහතික කිරීමේ අදහසින් මම රටතුළ පවතින සාකච්ඡාවට සහාය ලබා දීමට අදහස් කරන්නෙමි''යැයි එමර්සන් මහතා කියයි.

එමර්සන් මහතා දිවයිනේ ගත කරන දින පහ ඇතුළත විදේශ කටයුතු, නීතිය සහ සාමය, දක්ෂිණ සංවර්ධනය, අධිකරණ, ආරක්ෂාව, මුදල්, මාධ්‍ය, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම සහ හින්දු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යංශ ඇතුළත් ආණ්ඩුවේ නියෝජිතයන් සමග ඉහළ මට්ටමේ රැස්වීම් පැවැත්වීමට නියමිතය.

විශේෂ වර්තාකරු නීතිය බලාත්මක කරන නිලධාරීන් පාර්ලිමේන්තු මංත්‍රීවරුන්, පොලීසියේ විශේෂ දෙපාර්තමේන්තු සාමාජිකයන්, පොලිස් කොමිසම සහ මානව හිමකම් කොමිසම ද හමු වෙනු ඇත. ඊට අමතරව ඔහු ත්‍රස්තවාදී ක්‍රියා සම්බන්ධයෙන් සැකපිට හෝ දඬුවම් නියම වූ පුද්ගලයන් සමග සම්මුඛ සාකච්ඡා කිරීමට රැඳවුම් ස්ථානවලටද යනු ඇත.

ආණ්ඩුවේ ආරාධනයෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන එමර්සන් මහතා අන්තර්ජාතික ප්‍රජාවේ නියෝජිතයන්, නීතිඥයන්, ශාස්ත්‍රඥයන්, සහ රාජ්‍ය නොවන සංවිධාන සමග සාකච්ඡා කරනු ඇත. කොළඹට පැමිණෙන ඔහු අනුරාධපුරය සහ වවුනියාව ඇතුළත් වෙනත් ප්‍රදේශවල දින කීපයක් ගත කරනු ඇත.

සංචාරය අවසානයේ දී එමර්සන් මහතා 2017 ජුලි 14 සිකුරාදා පැය 15.00ට එක්සත් ජාතීන්ගේ පරිශ්‍රයේ දී (202 බෞද්ධාලෝක මාවත, කොළඹ 07 ) සිය නිරීක්ෂණ පුවත් සාකච්ඡාවකදී මාධ්‍ය සමග හුවමාරු කර ගනු ඇත. ඔහුගේ සංචාරය අවසානයේ කෙරෙන ප්‍රකාශය සහ පුවත් නිවේදනයේ පිටපත් ඉංග්‍රීසි භාෂාවෙන් ලබා දෙනු ඇත. සිංහල හා දෙමළ පරිවර්තන ද https://lk.one.un.org/ යනුවෙන්ද ලබා ගත හැකිය. පුවත් සාකච්ඡාව ආරාධනය ලත් ජනමාධ්‍යවේදීන්ට පමණක් දැඩිව සීමා වනු ඇත.
විශේෂ වාර්තාකරුගේ වාර්තාව 2018 මාර්තු මාසයේ දී ජිනීවා හිදී මානව අයිතිවාස්කම් කවුන්සලයට ඉදිරිපත් කරනු ඇත.

**අවසානය.**

බෙන් එමර්සන් මහතා (එක්සත් රාජධානිය) ත්‍රස්තවාදය පිටුදැකිමත් සමග මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ විශේෂ වාර්තාකරුය. කලින් පැවති එක්සත් ජාතින්ගේ මානව කොමිසම විසින් 2005 දී නිර්මාණය කරන ලද මැන්ඩේට් අධිකාරිය යටතේ ඔහු 2011 අගෝස්තු මස 1 වැනිදා සිය වැඩ කටයුතු භාර ගත්තේය. එම කටයුතු එක්සත් ජාතීන්ගේ මානව

අයිතිවාසිකම් කවුන්සලය 2007 දෙසැම්බර්, 2010 සැප්තැම්බර් සහ නැවත වරක් 2013 මාර්තු මස වසර තුනක් බැගින් වූ කාල සීමාවකට දීර්ඝ කරන ලදී.

විශේෂ වාර්තාකරුවන් මානව අයිතිවාසිකම් කවුන්සලයේ විශේෂ ක්‍රියා පටිපාටි යනුවෙන් හැඳින්වෙන කොටසකි. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පද්ධතියේ ස්වාධීන විශේෂඥයන්ගේ විශාලතම ආයතනය වන විශේෂ ක්‍රියා පටිපාටි ලෝකයේ සියලු තැන්වල නිශ්චිත රටවල තත්වයන් හෝ තේමාගත කරුණු ආමන්ත්‍රණය කරන ස්වාධීනව තොරතුරු රැස්කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණවල පොදු නාමයයි. විශේෂ ක්‍රියා පටිපාටි විශේෂඥයෝ ස්වේච්ඡා පදනමකින් කටයුතු කරති. එක්සත් ජාතීන් ගේ කාර්ය මණ්ඩලයට අයත් නොවන ඔවුන්ට තම කාර්යන් වෙනුවෙන් වැටුපක් ලැබෙන්නේ නැත. කිසියම් ආණ්ඩුවකින් හෝ සංවිධානයකින් ස්වාධීන වන ඔවුහු තම පුද්ගලික මට්ටමෙන් සේවය කරති.

ගෝලීය ත්‍රස්ත විරෝධී උපායමාර්ගය - UN 2006 Global Counter-Terrorism Strategy

එක්සත් ජාතින්ගේ මානව අයිතිවාසිකම් දේශීය පිටුව: ශ්‍රී ලංකාව - Sri Lanka

වැඩි විස්තර සහ මාධ්‍ය ඉල්ලීම් සඳහා කරුණාකර:

කොළඹදී (සංචාරය අතරතුර): ජූලියා රූ මෙනෙවිය ( +94(0)11 2580691 ext. 240 julia.raue@one.org )

ජිනීවා (සංචාරයට පෙර හෝ පසුව) ෂරොෆ් අසිසොව් (+ 41 22 917 9748 sazizov@ohchr.org හෝ ලිවීමට srct@ohchr.org)

වෙනත් එක්සත් ජාතීන්ගේ විශේෂඥයන්ට සම්බන්ධ මාධ්‍ය විමර්ශන සඳහා සබියේ කෙළායා, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මාධ්‍ය ඒකකය xcelaya@ohchr.org )

ඔබට මෙම මාධ්‍ය උපදේශනය මාර්ග ගතවද ( Online ) ලබා ගත හැකිය.

Tag and share – Twitter: @UNHumanRights and facebook: unitednationshumanrights

අප ජීවත් වන ලෝකය ගැන උනන්දු වන්නේ ද? එසේනම් අදම කෙනෙකුගේ අයිතිවාසිකම් වෙනුවෙන් නැගී සිටින්න. #Standup4humanrights and visit web page at http://www.standup4humanrights.org අපගේ වෙබ් පිටුවට පිවිස බලන්න.